# 12.0 : ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය හා ප්‍රතිපත්ති පිළිබඳ ව තුලනාත්මක ව විමර්ශනය කරයි.

## 12.1 : නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ හටගත් වෙනස්කම් විමර්ශනය කරයි.

- **නිදහසින් පසු ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් විස්තර කරයි.**
- **ආනයන ආදේශන ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ නම් කරයි.**
- **කාර්මීකරණ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ විස්තර කරයි.**
- **අපනයන අභිමුඛ කාර්මිකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිය අර්ථකථනය කරයි.**
- **අපනයන අභිමඛු කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ විස්තර කරයි.**
- **අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්ති මගින්ආර්ථිකයට වන බලපෑම විමර්ශනය කරයි.**

### නිදහසින් පසු ආර්ථිකය

- **නිදහසින් පසු ආර්ථික ලක්ෂණ අනුව අවධි කීපයක් හඳුනාගත හැකි ය.**
  - 1948 - 1960 දක්වා අවධිය
  - 1961 - 1977 දක්වා අවධිය
  - 1977 - 1994 දක්වා අවධිය
  - 1994 - 2015 දක්වා අවධිය

**1948 - 1960 දක්වා අවධියේ ප්‍රධාන ලක්ෂණ**

- යටත් විජිත යුගයේ පැවති ලක්ෂණ සුළු වෙනස්කම් සහිත ව ක්‍රියාත්මක වීම
- ලෝක බැංකු බලපෑම් ප්‍රථම වතාවට ආර්ථිකය මත පතිත වීම
- ආර්ථික සංවර්ධනයේ උපාය මාර්ගයක් ලෙස කෘෂිකර්මයට හා කර්මාන්තවලට ප්‍රබල තැනක් ලබා දීම
- යැපුම් කෘෂිකර්මාන්තය හා ගොවි ජනපද ව්‍යාපාරයේ ප්‍රගතියක් ඇති වීම
- ගෙවුම් ශේෂ අර්බුද ආරම්භ වීම
- ආර්ථික ක්‍රම සම්පාදනය සහ සැලසුම් සම්පාදනය ආරම්භ වීම
- අර්ධ විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය
- පුළුල් ශුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වීම
- ජනසතු ව්‍යාපාර ආරම්භ වීම

**1961 - 1977 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ**

- අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම
- විනිමය පාලනය, ද්විත්ව විනිමය අනුපාත ක්‍රමය ක්‍රියාත්මක වීම

- ආනයන පාලනය
- විදේශ විනිමය අර්බුද ඇති වීම
- ආනයන ආදේශන කාර්මික ප්‍රතිපත්ති ආරම්භ වීම
- අපනයන විවිධාංගීකරණය
- රාජ්‍ය අංශයේ මහා පරිමාණ කර්මාන්ත ආරම්භ වීම
- දේපොළ හා වත්කම් ප්‍රතිව්‍යාප්තිකරණය
- විනිමය අනුපාත ප්‍රතිසංස්කරණය

**1978 - 1994 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ**

- අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්වය
- ඒකීය විනිමය අනුපාත ක්‍රමයක් ඇති වීම
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ඉවත් ඇති කොට පාවෙන විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
- විනිමය පාලනය, හා ආනයන පාලනය ඉවත් කිරීම
- පාලන ප්‍රතිපත්ති ඉවත් කොට ඉල්ලුම් හා සැපයුම් බලවේග ඔස්සේ ක්‍රියාත්මකවන මිල ක්‍රමයකට ඉඩ සැලසීම
- ශුභසාධන ප්‍රතිපත්ති සීමා කිරිම
- ආර්ථිකය විවෘත කිරීම
- ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටු වීම
- පෞද්ගලීකරණය, ප්‍රතිව්‍යුහගතකරණය වැනි සැපයුම් පාර්ශ්වීය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- දරිද්‍රතාව අවම කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

**1994 - 2015 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ**

- දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ඔස්සේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති තව දුරටත් ක්‍රියාත්මක වීම
- විදේශ ආයෝජන සීමා වීම
- උතුරු නැගෙනහිර යුද්ධය අවසන් කිරීමට විශාල වියදමක් දැරීම
- යටිතල පහසුකම් සංවර්ධනය
- විදේශ ණය කෙරෙහි විශාල වශයෙන් යොමු වීම
- දේශීය කෘෂිකර්මාන්ත හා ඉදිකිරීම් කර්මාන්ත කෙරෙහි පුළුල් රාජ්‍ය අනුග්‍රහය දැක්වීම

**ආයනය ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තිය**

- ආනයන ආදේශන ප්‍රතිපත්ති යනු විදේශ රටවලින් ආනයනය කරන භාණ්ඩ සීමාකර, එම භාණ්ඩ දේශීය ව නිෂ්පාදනය කිරීමට පසුබිම සකස් කිරීම ය.
- පළමු ව සුබෝපභෝගී භාණ්ඩ හා අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කළ අතර එම භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය ආරම්භ කරන ලදි.

- දෙවනු ව අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයන සීමා කළ අතර, ඒවා දේශීය නිෂ්පාදනයට හා අභ්‍යන්තර හුවාමාරු කිරීම් මගින් වෙළෙඳපොළ අතරමැදියන් ලබන වාසි සීමා කරන ලදි (හාල්, මිරිස්, ලූණු ප්‍රවාහනය සීමා කිරීම).
- ආනයන ආදේශන කෘෂි නිෂ්පාදිතයන් ලෙස සහල්, ලූණු, මිරිස්, කවුපි, සෝයා, මුං ඇට, කුරහන් ආදී නිෂ්පාදිතයන් දිරිගන්වන ලදී.
- ආනයන ආදේශන කර්මාන්ත ලෙස සබන්, සුවඳ විලවුන්, රෙදිපිළි, ඇඟලුම්, බෙහෙත් ද්‍රව්‍ය ආදිපාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය දේශීය වශයෙන් දිරි ගන්වන ලදි.
- මෙකල පැවති විදේශ විනිමය අර්බුදය හා ගෙවුම් ශේෂ ගැටලුවලට විසඳුම්සෙවීම සඳහා මෙම ආනයන පාලනය හා විදේශ විනිමය වෙළෙඳපොළ සීමා කිරීම් සිදු කරන ලදී.

**අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය**

- ආනයනය කරන භාණ්ඩ වලට ආදේශන ලෙස දේශීය වෙළෙඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනවා වෙනුවට විදේශ වෙළෙඳපොළ ඉලක්ක කොට ගෙන තරගකාරී ව භාණ්ඩ නිෂ්පාදනය කරන කාර්මීකරණ ප්‍රතිපත්ති අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්ති ලෙස අදහස් කරයි.
- අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරිම ආරම්භ වූයේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දුන් 1977න් පසු කාලපරිච්ඡේදය තුළ ය.
- අපනයන අභිමබු කාර්මීකරණ ප්‍රතිපත්තයි ක ප්‍රධාන ම ඉලක්කය වන්නේ ආනයන සීමා කිරීම නොව අපනයන තරගකාරීත්වය හා අපනයන විවිධාංගීකරණය මගින් ලෝක වෙළෙඳපොළ තුළ සිය කොටස පුළුල් කර ගැනීම ය.

**1977 න් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්තියේ සෙසු ඉලක්ක වූයේ,**

- ගෙවුම් ශේෂ ගැටලු නිරාකරණය
- විදේශ විනිමය ගැටලු නිරාකරණය
- ආර්ථික වර්ධන උපාය මාර්ග ලෙස අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය
- අපනයන ඉලක්ක කර ගත් කර්මාන්ත වෙත විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම
- සේවා නියුක්ති අවස්ථා පුළුල් කිරීම සඳහා අපනයන වෙත යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය
- විදේශ විනිමය වෙළෙඳපොළ ප්‍රසාරණය කරනු පිණිස අපනයන ප්‍රසාරණය

**අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ**

- මෙය විවෘත ආර්ථික ප්‍රතිපත්තියේ අනුබලයක් ලෙස ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්තියකි.
- නිදහස් වෙළෙඳාමට ඉඩ ලැබෙන පරිදි ආනයන හා අපනයන සීමා ඉවත් කිරීම
- විදේශ විනිමය සීමා ඉවත් කිරීම
- ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ඇති කිරීම

- නිල විනිමය ක්‍රමය සහ වි.වි.හි.ස විනිමය අනුපාතය අහෝසි කොට විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම මත තීරණය වන නම්‍ය විනිමය අනුපාත ක්‍රමය ඇති කිරීම
- විදේශ විනිමය රට තුළට ගලා එන පරිදි පැවති විනිමය අනුපාතය 100% ක් අවප්‍රමාණය කිරීම
- විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ලිහිල් කිරීම, විදේශ බැංකු හා මූල්‍ය ආයතනවලට රට තුළට පැමිණීමට ඉඩ හසර ලබා දීම
- ආනයන තීරු බදු ඉවත් කිරීම හා ආනයන තීරු බදු ලිහිල් කිරීම
- අපනයනය සඳහා පැවති රාජ්‍ය ඒකාධිකාරිය අහෝසි කොට තරගකාරීව අපනයනයට අවස්ථාව ලබා දීම

## 12.2 : ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා ගවේෂණය කරයි.

- **කාලීන දත්ත ඇසුරෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ ව්‍යුහමය වෙනස්කම් විස්තර කරයි.**
- **ආර්ථිකයේ සේවා නියුක්තිය, විදේශ සේවා නියුක්තිය, ප්‍රේෂණ, යටිතල පහසුකම් සංවර්ධනය, සංචාරක කර්මාන්තය හා ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ ව කාලීන දත්ත ඇසුරෙන් විග්‍රහ කරයි.**
- **සේවා නියුක්තිය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ හේතු වූ සාධක විස්තර කරයි.**
- **සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා විශ්ලේෂණය කරයි.**
- **ප්‍රදේශීය සංවර්ධනයේ වැදගත්කම පැහැදිලි කරයි.**
- **ආර්ථිකයේ ප්‍රදේශීය සංවර්ධන විෂමතා ඇති වීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.**

**ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති වූ ව්‍යුහමය වෙනස් වීම්**

- දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහමය වෙනස්කම්
- සේවා නියුක්තියේ ව්‍යුහය වෙනස් වීම

**දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහය කාලීන ව පහත පරිදි වෙනස් වී ඇත.**

නිදසුන් :

- කෘෂිකාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම අඩු වීම
- කාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම වැඩි වීම
- සේවා නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම වැඩි වීම

( මහ බැංකු වාර්තා ඇසුරෙන්)

**සේවා නියුක්තියේ ව්‍යුහය කාලීන වශයෙන් වෙනස් වී ඇත.**

නිදසුන් :

- කෘෂි අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය අඩු වී ඇත.
- කාර්මික අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.
- සේවා අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.

**සේවා නියුක්තිය : 1963 - 2016**

| අංශය | 1963 | 1973 | 1981/82 | 1996/97 | 2003/04 | 2013 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකාර්මික | 46.3 | 37.8 | 28.6 | 27.6 | 26.3 | 19.9 | 8.5 | 8.1 |
| කාර්මික අංශය | 36.9 | 45.4 | 47.9 | 42.8 | 47.7 | 52.8 | 54.6 | 56.3 |
| සේවා අංශය | 37 | 34 | 29 | 37 | 40 | 40 | 44 | 44 |

- දළ දේශීය නිෂ්පාදිතයේ ආංශක සංයුතිය තුළ හා සේවා නියුක්තියේ ආංශික සංයුතිය තුළ කෘෂිකාර්මික අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම අඩු වී කාර්මික අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම සහ සේවා අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම වැඩි වී ඇත.
- 1977 න් පසු ශ්‍රී ලංකාව වඩාත් විවෘත ආර්ථික රටාවක් කර මාරුවීමත් සමග ශ්‍රී ලාංකීය සේවකයන් විදේශ සේවා නියුක්තිය කරා යොමු වීමේ ප්‍රවණතාව වැඩි වී ඇති බව පෙනී යයි. එහි අතුරු ඵලයක් ලෙස විදේශවලින් ගලා එන ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වී ඇත.

| විදේශ සේවා නියුක්තිය | 2017 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මුළු විදේශ රැකියා | 30073 | 100 | 263443 | 100 | 242930 | 100 |
| ස්ත්‍රී පුරුෂ බව | | | | | | |
| පුරුෂ | 190217 | 63.3 | 172788 | 65.6 | 16032 | 66.0 |
| ස්ත්‍රී | 110486 | 36.7 | 90655 | 34.4 | 82628 | 34.0 |
| ශ්‍රම බාණ්ඩය අනුව | | | | | | |
| වෘත්තීය | 5372 | 1.8 | 6251 | 2.4 | 6574 | 2.7 |
| මධ්‍යම | 20778 | 6.9 | 6951 | 2.6 | 8235 | 3.4 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත පුහුණු ශ්‍රමික | 29267 | 9.7 | 12501 | 4.7 | 19864 | 4.5 |
| පුහුණු ශ්‍රමික | 73162 | 24.3 | 81682 | 31.0 | 76559 | 31.5 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 3977 | 1.3 | 4847 | 1.8 | 3939 | 1.6 |
| නුපුහුණු ශ්‍රමික | 79519 | 26.4 | 77985 | 29.6 | 71641 | 29.6 |
| ගෘහ සේවිකා | 88628 | 29.5 | 73226 | 27.8 | 65127 | 26.8 |

## විදේශ සේවා නියුක්තියේ මෑත කාලීන ප්‍රවණතා

- 2016 වසරේ විදේශ රැකියා සඳහා පිටත් ව යන්නන්ගේ 7.8%ක පහළ යාමක් වාර්තා විය.
- විදේශ සේවා නියුක්තිය සඳහා පිටත් ව යන්නන් අඛණ්ඩ ව අඩුවීමට හේතු වූයේ, ගෘහසේවිකා පිටත් ව යාම් අඩු කිරීමට රජය ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, පිටත් වීමට පෙර සපුරාලිය යුතු පුහුණු අවශ්‍යතා සහ මැද පෙරදිග රටවල ආර්ථික පසුබැසීම හේතුවෙන් ශ්‍රම ඉල්ලුම පහළ යාම යි.
- දකුණු කොරියාවේ රැකියා සඳහා පිටත් වීම් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ ද ඉන් වැඩි ප්‍රතිශතයක් (97%) නුපුහුණු ශ්‍රමික කාණ්ඩයට අයත් වේ.

- පුහුණු කාණ්ඩය යටතේ විදේශ රැකියා සඳහා පිටත් වීම් වැඩි වන විට විදේශ ප්‍රේෂණ ගලා ඒම් වැඩි වනු ඇත.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2017 අය වැය මගින් යෝජනා කළ පරිදි නුපුහුණු ශ්‍රමිකයකුගේ අවම වැටුප $ 350 ලෙස ද පුහුණු ශ්‍රමිකයකුගේ අවම වැටුප $ 450 ලෙස ද නියම කරන ලදී.

**විදේශ ප්‍රේෂණ**

- විදේශ සේවා නියුක්ත ලාංකීය ශ්‍රමිකයින් මෙරටට එවන විදේශ මුදල් හා වෙනත් ද විදේශ ප්‍රේෂණ ලෙස හඳුන්වයි. ශ්‍රී ලංකාවේ මුළු විදේශ ලැබීම් තුළ ඉහළ ම වැදගත්කම හිමි කර ගන්නේ විදේශ ප්‍රේෂණයන් ය.

- **විදේශ සේවා නියුක්තීන්ගේ ප්‍රේෂණ**

එක්සත් ජනපද ඩොලර් මිලියන

| ප්‍රභවය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| 1. මැද පෙරදිග | 3358 | 3562 | 3902 | 3796 | 3889 | 3711 | 3592 | |
| 2. යුරෝපා සංගමය | 1071 | 1160 | 1270 | 1222 | 1282 | 1311 | 1312 | |
| 3. ඈත පෙරදින ආසියාව | 509 | 557 | 611 | 698 | 739 | 824 | 849 | |
| 4. අනෙකුත් යුරෝපා රටවල් | 275 | 308 | 337 | 307 | 333 | 330 | 309 | |
| 5. උතුරු ඇමරිකාව | 174 | 186 | 204 | 209 | 210 | 208 | 182 | |
| 6. ගිනිකොන දිග ආසියාව | 63 | 288 | 316 | 391 | 398 | 394 | 407 | |
| 7. ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය | 132 | 147 | 161 | 161 | 174 | 172 | 154 | |
| 8. දකුණු ආසියාව | 90 | 83 | 91 | 98 | 109 | 107 | 154 | |
| 9. දකුණු හා මධ්‍යම ඇමරිකාව | 48 | 58 | 63 | 63 | 51 | 50 | 35 | |
| 10. අනෙකුත් | 66 | 58 | 63 | 63 | 51 | 57 | 21 | |
| එකතුව | 5985 | 6407 | 7018 | 6980 | 7242 | 7164 | 7015 | |

- විදේශ ප්‍රේෂණ ලැබීම්වල අඩු වීමක් 2015 වසරේ දී වාර්තා කළ ද 2016 වර්ෂයේදී එය මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇත. පසුගිය වසරවල විදේශ ප්‍රේෂණ අඩු වී ඇත්තේ මැද පෙරදිග රටවල රැකියා සඳහා පිටත් ව ගිය ශ්‍රමිකයන් ක්‍රමයෙන් අඩු වීම හා මැද පෙරදිග රටවල ආර්ථික පසුබෑම නිසා ශ්‍රම ඉල්ලුම අඩු වීම ය.

**විදේශ සේවා නියුක්තිය හා විදේශ සේවා ප්‍රේෂණ ලැබීම් ආර්ථිකය මත ඇතිකරන බලපෑම**

- සේවා වියුක්ති අනුපාතය පහළ යාමට ඉවහල් වීම
- පුද්ගලයින්ගේ ආදායම් ඉහළ යාම
- දරිද්‍රතාව පහළ යාම
- කුටුම්බ ඉතුරුම් වැඩි වී කුඩා ව්‍යවසායන් වර්ධනය වීම
- විදේශ ඉපයීම් වර්ධනය වීම
- ගෙවුම් ශේෂ ගැටලුවලට ප්‍රබල විසඳුමක් වීම

- විදේශ වත්කම් ශක්තිමත් වීම
- මුදලේ විදේශ අගය ඉහළ යාම
- දේශීය ශ්‍රම වෙළෙඳපොළේ පුහුණු ශ්‍රම හිඟයක් ඇති වීම හා වැටුප් වට්ටම් ඉහළ යාම
- පුහුණු ශ්‍රමය විදේශගත වන විට සම්පත් සම්භාරය සංකෝචනය වීම
- ගෘහ සේවය සඳහා කාන්තාවන් සංක්‍රමණය වීම සමාජ ගැටලුවලට හා දරුවන් හුදෙකලා වීම හා අනාරක්ෂිත වීමට හේතු වීම

## යටිතල පහසුකම්

- රටක නිෂ්පාදන හා හුවමාරු ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට හා ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට උපස්තම්බන වන ප්‍රාග්ධනය, යටිතල පහසුකම් ලෙස හඳුන්වයි. යටිතල පහසුකම් පහත පරිදි වර්ග කළ හැකි ය.

**යටිතල පහසුකම්**

- **ආර්ථික යටිතල පහසුකම්**
  - දෘඩ පහසුකම්
    - මහා මාර්ග
    - අධිවේගී මාර්ග
    - පාලම්
    - උමං
    - දුම්රිය මාර්ග
    - වාරි මාර්ග
    - ගුවන් තොටුපළ
    - වරාය
    - විදුලි සංදේශ
    - ප්‍රවාහන පද්ධති
  - මෘදු පහසුකම්
    - වෘත්තීය පුහුණු වැඩ සටහන්
    - මූල්‍ය ආයතන පහසුකම්
    - පර්යේෂණ හා සංවර්ධන පහසුකම්
    - තාක්ෂණ හුවමාරුව
    - අපනයන දිරිගැන්වීම්
- **සමාජ යටිතල පහසුකම්**
  - දෘඩ පහසුකම්
    - රෝහල්
    - පාඨශාලා
    - ජල සම්පාදනය
    - නිවාස
    - ළමා රැකවරණය
    - වැඩිහිටි රැකවරණය
    - බන්ධනාගාර
    - කසළ බැහැර කිරීම
  - මෘදු පහසුකම්
    - සමාජ ආරක්ෂණය
    - ප්‍රජා සේවය
    - පරිසරය සුරැකීමේ
    - ව්‍යාපෘති

- යටිතල පහසුකම් සඳහා වන ආයෝජනය යනු ආර්ථිකය කාර්යක්ෂමව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය කෙරෙන සේවා සහ පහසුකම් සැපයීමට භෞතික හා සංවිධාන ව්‍යුහයන් ගොඩ නැංවීම ය. යටිතල පහසුකම් රටක හෝ ප්‍රාදේශීය සංවර්ධනය පිළිබිඹු කෙරෙන වැදගත් දර්ශකයකි.
- යටිතල පහසුකම් ක්ෂේත්‍රය ආර්ථික හා සමාජීය වශයෙන් උප කොටස් දෙකකට වර්ග කළ හැකි ය. ආර්ථික යටිතල පහසුකම් යනු මහා මාර්ග, ජල සම්පාදන හා ජලා පවහන පහසුකම්, සන්නිවේදන පහසුකම් ජාල යනාදිය ය. සමාජ යටිතල පහසුකම් වනුයේ පාසල්, විශ්වවිද්‍යාල, රෝහල්, නිවාස සංවර්ධනය යනාදිය වේ.
- යටිතල පහසුකම් සඳහා කරනු ලබන ආයෝජනය ආර්ථික වෘද්ධියට විවිධාකාරයට දායක වේ. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම රටක සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණ දෙන ප්‍රධාන බාධකයකි. අසතුටු දායක මංමාවත්, වාහන තදබදය, කෙටි දුරක් යාමට වැඩි කාලයක්

ගත වීම යනාදිය සංවර්ධන ක්‍රියාවලියට බලපාන සරල බාධාවන් වේ. මහා මාර්ග, පාලම්, වරාය, දුම්රිය මාර්ග, සන්නිවේදන ජාල, වාරිමාර්ග පහසුකම් සංවර්ධනය කිරීම ආර්ථික වෘද්ධියට විශාල අනුබලයක් වේ.

- යටිතල පහසුකම් සංවර්ධනය වී ඇති විට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සහ ඒවා වෙළෙඳපොළට බෙදාහැරීම ඉතා පහසුවෙන් හා කාර්යක්ෂම ව කළ හැකි වේ.

- මෑත දී සිදු කරන ලද පර්යේෂණ හා අධ්‍යයන මගින් හෙළි කොට ඇත්තේ යටිතලපහසුකම් ඉහළ යන සෑම 10% ක් පාසා ම දිගුකාලීන නිමැවුම 1%කින් වර්ධනය වන බව ය.

**යටිතල පහසුකම් ආර්ථික හා සමාජීය වශයෙන් වැදගත් වීමට බලපාන හේතු**

- ඵලදායිත්වය ඉහළ යාම
- ආර්ථික වෘද්ධිය වේගවත් වීම
- ආයෝජකයින් ආකර්ෂණය කිරීමට පිටිවහල් වීම
- ආයෝජකයින්ගේ පෞද්ගලික පිරිවැය අඩු වීමට ඉවහල් වීම
- අපතේ යාම් සහ නාස්ති වීම් අවම වීමට ඉවහල් වීම
- කළමනාකරණය හා සම්බන්ධීකරණය කාර්යක්ෂම වීම
- ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු වීමට ඉවහල් වීම
- සමාජ සංවර්ධනයට හේතු වීම
- මානව ප්‍රාග්ධනය බිහි වීමට හේතු වීම
- ආර්ථිකයේ තරගකාරිත්වය ඉහළ යාම

**යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රවේශ වන මූලාශ්‍ර**

- යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජන
- යටිතල පහසුකම් සඳහා ස්වේච්ඡා ආයෝජන
- යටිතල පහසුකම් සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (PPP)

- **යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජන පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.**

| | ආර්ථික සේවා | | සමාජ සේවා | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| වර්ෂය | රුපියල් බිලියන | දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතයක් ලෙස | රුපියල් බිලියන | දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතයක් ලෙස | රුපියල් බිලියන | දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතයක් ලෙස |
| 2012 | 343.8 | 3.9 | 71.2 | 0.8 | 415.0 | 4.8 |
| 2013 | 369.4 | 3.9 | 77.6 | 0.8 | 447.0 | 4.7 |
| 2014 | 330.1 | 3.2 | 112.3 | 1.1 | 442.5 | 4.4 |
| 2015 | 429.0 | 3.6 | 117.3 | 1.0 | 541.3 | 4.6 |

- ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය ආයෝජන, දළ දේශීය නිෂ්පාදන ප්‍රතිශතයක් ලෙස 5% කට ආසන්න මට්ටමේ පවතී. නමුත් ආර්ථිකයේ තරගකාරිත්වය වැඩි දියුණු කිරිම සඳහාත්, ආර්ථික වෘද්ධියේ උපරිම මට්ටමට ළඟා වීම සඳහාත් විදේශ ඍජු ආයෝජන ආකර්ෂණය කිරීම සඳහාත්, යටිතල පහසුකම් සංවර්ධනයේ ආයෝජනය තව දුරටත් ඉහළ නැංවීමේ අවශ්‍යතාව පවතී. ඒ සඳහා ඇති ප්‍රබල බාධාවන් වන්නේ රාජ්‍ය ආදායම් සීමිත වීම, රාජ්‍ය ණය ඉහළ යාම වළක්වා ගැනීම, රාජ්‍ය ණය ආපසු ගෙවීම් හැකියාව සීමිත වීම ආදියයි. මේ තත්ත්වය යටතේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය තුළින් යටිතල පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීම වැදගත් වේ.

- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමය ඔස්සේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පෞද්ගලික අංශය දිරිගැන්වීමට ලෝක බැංකුවේ හා USAID ආයතනයේ සහාය ඇති ව මුදල් අමාත්‍යාංශය තුළ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා 2017 ජනවාරි මාසයේ දී අමාත්‍යාංශ අනුමතිය හිමි විය.

- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය දිරි ගැන්වීමේ රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව මගින් දේශපාලනඥයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් ඇතුළු සියලු ම පාර්ශව කරුවන්ගේ දැනුම්වත් බව ඉහළ නැංවිය යුතු අතර පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීම සහ සේවාවල ගුණාත්මක භාවය සහ සාධාරණ මිල ගණන් සහතික කිරීමට සුදුසු නියාමන හා පරිපාලන යාන්ත්‍රණය නිර්මාණය කළ යුතු ය. ආර්ථික හා සමාජ යටිතල පහසුකම්වල පෞද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථාවර ප්‍රතිපත්ති, යහපාලනය. විනිවිද භාවය, ආයතනික හැකියා වැඩි දියුණු කිරීම, ඵලදායි නියාමනයන් හා කාර්යක්ෂම මූල්‍ය වෙළෙඳපොළවල් ආදි පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු ය. මේ අතර කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා වෙන් කිරීම තහවුරු කිරීම සඳහා ආර්ථිකයට වැඩි ප්‍රතිලාභ හිමි වන අයුරෙන් ව්‍යාපෘතිවල ප්‍රමුඛතා අනුපිළිවෙල හඳුනා ගැනීමට යටිතල පහසුකම් ව්‍යාපෘති පුළුල් ශඛ්‍යතා අධ්‍යයනයකට ලක් කළ යුතු යි.

## යටිතල පහසුකම් සංවර්ධනයෙහි ලා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය

- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ යටිතල පහසුකම් සංවර්ධනයෙහි ලා වඩාත් සාර්ථක ක්‍රමවේදයකි. තනිකරම පෞද්ගලික අංශය හෝ රාජ්‍ය අංශය හෝ ම කාර්යයන් ඉටු කරනවා වෙනුවට, ඒ දෙපාර්ශ්වය ම සහභාගි වෙමින් තම තමන්ට වඩාත් හොඳින් කළ හැකි කාර්යයන් ඒ ඒ පාර්ශ්වය විසින් තෝරා ගෙන ව්‍යාපෘති ක්‍රියාවට නැගිය හැකි වේ.

- ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය කඩිනම් කරමින් ප්‍රමාද වීම වලක්වා ගත හැකි වේ. කාර්ය සාධනය මනින දර්ශකයක් ලෙස ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය යොදා ගත හැකි ය.

- තනිකර ම රජය හෝ පෞද්ගලික අංශය හෝ ඉටු කරන ව්‍යාපෘතියකට වඩා ඉහළ ආයෝජන ලාභ අනුපාතිකය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති මගින් අත්කර ගත හැකි ය. දෙපාර්ශවයම එක් ව ක්‍රියාත්මක කරන විට සැලසුම් කිරීම හා මූල්‍යනය යන කරුණු සලකා නව්‍ය ක්‍රමවේද යොදා ගැනීමට අවස්ථාව සැලසේ.

- ව්‍යාපෘතියක අවදානම් සියල්ල ඇගයීමකට ලක් කොට එහි ශක්‍යතාව තීරණය කරනු ලැබේ. හුදෙක් රජයේ හෝ දේශපාලන අවශ්‍යතා සහ වෙනත් අභිලාශයන් මත ශක්‍යතාවකින් තොර ව්‍යාපෘතියක් ක්‍රියාවට නැගීමට සැලසුම් කරනු ලැබුවහොත් පෞද්ගලික අංශය එවැන්නක් කිරීමට එකඟ නොවනු ඇත.
- පිරිවැය පාලනය කිරීමේලා වඩා පළපුරුද්ද සහ අත්දැකීම් ඇති පෞද්ගලික අංශය වෙත ව්‍යාපෘති මෙහෙයවීම් සහ ක්‍රියාවට නැගීමේ අවදානම් පැවරීමට රජයට අවස්ථාව සැලසේ.

  බොහෝ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති තුළ කල් තබා ව්‍යාපෘති නිම කිරීම වෙනුවෙන් ලබා දෙන ප්‍රසාද දීමනා (bonus) ඇතුළත් වන බැවින්, සියලු ව්‍යාපෘති වඩාත් කාර්යක්ෂම ව නිම කිරීමට හැකියාව ලැබේ.

- රජයේ අරමුදල් වඩාත් කාර්යක්ෂම ලෙස වැය කිරිම මේ යටතේ ඉඩ සැලසෙන බැවින් සමාජ ආර්ථික වැදගත්කමක් ඇති වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි සීමිත රාජ්‍ය අරමුදල් යොමු කිරීමට අවස්ථාව උදා වේ.
- රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව සහිත ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාව වැඩි බැවින් එය රාජය මූලයට වාසිදායක වේ. අයවැය පරතරය අඩු කර ගැනීමට දායක වනු ඇත.
- ව්‍යාපෘති ජීවන චක්‍රයේ සෑම අදියරක දීම ඉහළ ප්‍රමිති මට්ටමක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබේ.
- රාජ්‍ය වියදම් අඩු කර ගැනීමට ඉඩ සැලසෙන බැවින් ජනතාව මත බදු බර ද අඩු විය හැකි ය.
- පෞද්ගලීකරණ ක්‍රමවේදයන්ට සමාජයේ දැඩි විරෝධතාවක් පවතනි විට එයට සාර්ථක ව මුහුණ දිය හැකි විකල්ප ප්‍රවේශයක් ලෙස රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති දැකිය හැකි ය.

## සංචාරක කර්මාන්තය

- ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි විදේශ විනිමය උපයන ප්‍රධාන අංශයක් වන සංචාරක කර්මාන්තය අඛණ්ඩ ව වර්ධනය වීමේ ප්‍රවණතාවක් පෙන්වයි. ඉතිහාසයේ පළමු වර මිලියන දෙකෙහි සන්ධිස්ථානය පසු කරමින් 2016 වසරේ දී සංචාරක පැමිණීමේ සංඛ්‍යාව 2,050,832 ක් දක්වා 14% ක කැපී පෙනෙන වාර්ෂික වර්ධනයක් වාර්තා කළේ ය.
- **සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා පිටුවහල් වූ සාධක වනුයේ,**
  - සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කළ ආයෝජනය ඉහළ යාම
  - නව ගුවන් සේවා, මඟී නෞකා සේවා ක්‍රියාත්මක වීම
  - ජාත්‍යන්තර සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීමේ වැඩ සටහන් ක්‍රියාත්මක වීම
  - ලෝකයේ ප්‍රධාන සංචාරක ගමනාන්තවල භූගෝලීය, දේශපාලනික අවිනිශ්චිතතා වර්ධනය වීම
- අප්‍රිකාව හැර අනෙකුත් ප්‍රධාන කලාප සියල්ලෙන් ම සංචාරක පැමිණීම වර්ධනය විය. ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණෙන විශාලතම සංචාරක කලාපය බටහිර යුරෝපයෙනි (31%කි). 2016 වසරේ දී මෙම කලාපයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 64333කි.

- නැගෙනහිර ආසියාවෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 20.7% කි. 2016 වසරේ දී වැඩි ම සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණි රට ඉන්දියාවයි. දෙවනු ව චීනය ය. තෙවන රට එක්සත් රාජධානියයි. සංචාරකයින් පැමිණීමේ අරමුණ අනුව බලන විට වැඩි ප්‍රතිශතයක් විවේකය ගත කිරීම සඳහා ය.

- මෑත වර්ෂවල සංචාරක ඉපයීම් අඛණ්ඩ ව වර්ධනය වූ අතර එමගින් සේවා ගිණුම ශක්තිමත් විය. 2016 වසරේ මුළු සංචාරක ඉපැයීම් එක්සත් ජනපද ඩොලර් මිලියන 3518 කි. එය පෙර වසරට වඩා 18% ක වර්ධනයකි.

- මෑත වර්ෂවල දී සංචාරක අංශයේ ආයෝජන දිගට ම වර්ධනය විය. 2015 වසරේ දී අනුමත වූ හෝටල් ව්‍යාපෘති 37 සමග සැසඳීමේ දී 2016 වසරේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 526 කින් සමන්විත හෝටල් ව්‍යාපෘති 41ක් සඳහා අනුමැතිය ලැබී තිබිණි.

- රටෙහි නැගෙනහිර සහ උතුරු පළාත්වල සංචාරක කර්මාන්තයේ ඉහළ විභවතක් උකහා ගැනීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ අවධානය යොමු වීමත් සමඟ එම පළාත්වල සංචාරක කර්මාන්තයේ අඛණ්ඩ ව වර්ධනය විය.

- පසුගිය වසර කීපය තුළ ප්‍රබල ප්‍රවර්ධන වැඩ සටහන් හා සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ගන්නා ලද පියවර මෙරටට විදේශ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වූව ද, ශ්‍රී ලංකාව තවමත් ගෝලීය වෙළෙඳපොළ තුළ තම පූර්ණ විභවතාව ළඟා කර ගෙන නොමැත.

- **සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.**

| ශීර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 (අ) | වාර්ෂික වෙනසවීම (%) 2016 |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් සංඛ්‍යාව | 1,000,605 | 1,274,593 | 1,527,153 | 1,798,380 | 2,050,382 | 14.0 |
| පැමිණීමේ අරමුණ අනුව | | | | | | |
| විනෝදාස්වාදය | 748,436 | 915,208 | 1,037,644 | 1,198,240 | 1,710,027 | 42.7 |
| ව්‍යාපාර | 90,040 | 67,946 | 20,270 | 23,323 | 37,121 | 59.2 |
| වෙනත් | 167,129 | 291,439 | 469,239 | 576,817 | 303,684 | -47.4 |
| සංචාරකයින් ගත කළ රාත්‍රී | 10,056 | 10,909 | 15,119 | 18,163 | 20,918 | 15.2 |
| කාමර උපයෝජනය | 71.2 | 71.7 | 74.3 | 74.5 | 74.8 | 0.4 |
| දළ සංචාරක ලැබීම් | 132,427 | 21,72 | 317,79 | 405,492 | 512,373 | 26.4 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් | 131,688 | 173,594 | 207,889 | 225,476 | 249,837 | 10.8 |
| මුළු සේවා වියුක්තිය | 162,869 | 270,150 | 299,890 | 319,436 | 335,659 | 5.1 |
| ඍජු සේවා නියුක්තිය | 67,862 | 112,550 | 129,790 | 135,930 | 146,115 | 7.5 |
| වක්‍ර සේවා නියුක්තිය | 95,007 | 157,600 | 170,100 | 183,506 | 189,544 | 3.3 |

මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා මහ බැංකුව

- මෑත කාලයේ විදේශ විනිමය ඉපයීම හා සේවා නියුක්තිය සම්බන්ධයෙන් සංචාරක කර්මාන්තයේ දායකත්වය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

**විදේශ විනිමය ඉපයීම**

| මුදල් ඒකකය | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රුපියල් මිලියන | 405,492 | 512,373 | 598,143 | 711,961 | |
| ඇමරිකානු ඩොලර් මිලියන | 2,981 | 3,518 | 3,925 | 4,381 | |

- ශ්‍රී ලංකාවේ මුළු විදේශීය විනිමය ඉපයීම් සඳහා සංචාරක කර්මාන්තයේ දායකත්වය 2015 දී 12% ක් වූ අතර 2016 වර්ෂයේ දී එය 14.2% ක් විය. විදේශ ප්‍රේෂණ සහ රෙදිපිළිවලට හා ඇගලුම්වලට පසුව තුන් වැනි තැනට පත්ව ඇත්තේ සංචාරක කර්මාන්තයයි.

**සේවා නියුක්තිය දායකත්වය**

| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| ඍජු සේවා නියුක්තිය | 129,790 | 135,930 | 146,115 | 156,369 | 169,003 | |

- සංචාරක කර්මාන්තය බිහි කළ ඍජු සහ වක්‍ර සේවා නියුක්තිය 2015 දී 319,436 ක් වූ අතර, 2016 දී 335,659 ක් විය.

**සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග**

1. සංචාරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමී ව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම.
   - අපේක්ෂිත විශාල සංචාරක ප්‍රමාණයකට පහසුකම් සැලසීම සඳහා හෝටල් කාමර 40,000 ත් 50,000 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වෙතැයි ඇස්තමේන්තු කොට ඇතත්, 2016 අවසානයේ දී සංචාරක හෝටල් සහ අතිරේක ආයතන යන දෙඅංශය ම සතු ව ඇත්තේ හෝටල් කාමර 34,000 ක් පමණි.
2. සංචාරක ක්ෂේත්‍රයේ නියැළුණු ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයින් විශාල පිරිසක් ඉහළ වැටුප් වෙනුවෙන් විදේශීය රටවල සේවයේ යෙදී සිටී.
   - සංචාරක කර්මාන්තයේ ඉහළ යන පුහුණු ශ්‍රමික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය සේවක පුහුණු කිරීම රජයට කිරීම සිදු කළ නොහැකි බැවින් ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.
3. ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නොවීම.
   - බොහෝ ප්‍රමුඛ පෙළේ හෝටල් දාම ඔවුන්ගේ හෝටල් ව්‍යාපාර ශ්‍රී ලංකාවෙන් තවමත් ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත කොට නොමැත. ෆෝබ්ස් සඟරාව නම් කර ඇති ලොව හොඳම අන්තර් ජාතික සුඛෝපභෝගී හෝටල් දාම සන්නාම 10 අතුරෙන් ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ හෝටල් දාම තුනක් පමණි.
4. සංචාරක කර්මාන්තයේ විධිමත් අංශය හොඳින් නියාමනය වී තිබුණ ද. කර්මාන්තය තුළ සැලකිය යුතු අවිධිමත් අංශයක් ක්‍රියාත්මක වෙමින් පවතී.
   - එබැවින් විධිමත් අංශය වෙත එම කොටස ද අන්තර් ග්‍රහණය කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. නොවිධිමත් අංශය තුළ සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව සහ

ආචාර ධර්ම වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වන අතර, එසේ කිරීමට අපොහොසත් වීම රටේ යහපත් ප්‍රතිරූපය බිඳ වැටීමට හේතු වනු ඇත.

5. විශාල විභවතාවක් පවතින චීනයෙන් පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනයට සරිලන සේ පහසුකම් සැපයීම ඇති හැකියාව අඩුයි.

   ▪ සංචාරක කර්මාන්තයේ දැනට පවතින වර්ධනය වෙමින් පවතින චීන සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීමේ දී නව අභියෝග නිර්මාණය වී ඇත. එහි දී චීන භාෂාවෙන් විකාශනය වන රූපවාහිනිය හා ගුවන්විදුලි නාලිකා, චීන භාෂාව කතා කරන සංචාරක මග පෙන්වන්නන් ආදිය අවශ්‍ය වේ.

6. නැවතී සිටින රාත්‍රි සංඛ්‍යාව ලෙස ගණනය කෙරෙන සංචාරකයකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව වසර ගණනාවක් පුරා එකලෙස ම පැවතීම

   ▪ දෛනික සංචාරක වියදම පසුගිය වසර කීපය පුරා වර්ධනය වී තිබුණ ද, ප්‍රධාන වශයෙන් ම සංචාරකයන් සඳහා ශ්‍රී ලංකාවේ පවතින ක්‍රියාකාරකම් අඩු වීම නිසා සංචාරකයකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව රාත්‍රි 10 ක් පමණ නොවෙනස් ව පවතී. එම නිසා ශ්‍රී ලංකාවේ පවතින සංචාරක ආකර්ෂණයන් විවිධාංගකරණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු වන අතර එහි දී සංචාරක රාත්‍රි කාල සීමාව අවම වශයෙන් සති දෙකක් ලෙස ඉලක්ක කිරීම සඳහා මඟී නෞකා සහ සාමුද්‍රික සංචාර, විවේකය අමුණු කරගත් සංචාර, විනෝදාස්වාදය අරමුණු කර ගත් සංචාර වැනි සංචාරක කර්මාන්තයේ පසුගාමී අංශ කෙරෙහි වඩාත් අවධානය යොමු කළ යුතු වේ.

7. සංචාරකයන් සඳහා සේවා සැපයීම ප්‍රමාණවත් නොවීම

   ▪ තොරතුරු ලබා ගැනීම සඳහා පමණක් නොව, බස්රථ, කුලී රථ සහ හෝටල් වෙන් කිරීම්, ජංගම දුරකථන සම්බන්ධතා, වයි-ෆයි සම්බන්ධතා, සංචාරක සැලසුම් ආදී වූ පුළුල් පරාසයක පැතිරෙන පරිදි සංචාරකයන්ට සේවා සපයන්නා වූ බහුකාර්ය සංචාරක තොරතුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව ප්‍රධාන සංචාරක ආකර්ෂණයන් හි සහ ප්‍රධාන ප්‍රවාහණ කේන්ද්‍රස්ථානයන්හි තව දුරටත් වැඩි කිරීම අවශ්‍යතාවක් පවතී.

8. සංචාරක කර්මාන්තය සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය ප්‍රමාණවත් නොවීම.

   ▪ සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ රාජ්‍ය ආයතන ද පෞද්ගලික අංශය ද ඇතුළු ව සංචාරක කර්මාන්තයේ නියුතු සියලු ම පාර්ශ්වකරුවන් අධීක්ෂණය කිරීම සඳහා ඉහළ මට්ටමේ රාජ්‍ය ව්‍යුහයක් අවශ්‍ය වන අතර එමගින් වඩා සහසම්බන්ධතාවකින් යුතුව ඉහළ මට්ටම් ක්‍රමෝපාය ක්‍රියාවට නැඟීමට ඉඩ සැලසෙනු ඇත.

## දැනුම් ආර්ථිකය

▪ දැනුම් ආර්ථිකය යනු බුද්ධිමය ප්‍රාග්ධනය මත පදනම් වූ පරිභෝජනය සහ නිෂ්පාදන ක්‍රියාවලියකි. දැනුම් ආර්ථිකය සාමාන්‍යයෙන් සංවර්ධිත රටවල සියලු ආර්ථික ක්‍රියාකාරකම්වල විශාල කොටසකි. දැනුම් ආර්ථිකය තුළ ස්වාභාවික වටිනාකම් වලින් සැලකිය යුතු කොටසක් අස්පෘශ්‍ය වත්කම්වලින් සමන්විත වන අතර, එහි සේවක දැනුම් (බුද්ධිමය ප්‍රාග්ධනයේ) වටිනාකමක් ඇතත් සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුව මෙම වත්කම් ශේෂ පත්‍රවල ඇතුළත් කිරීමට ඉඩ නොදෙනු ඇත.

- සංවර්ධිත රටවල් කෘෂිකර්මාන්තය සහ නිෂ්පාදන ආර්ථිකය පදනම් කර ගෙන සටින අතර, දියුණු වෙමින් පවතින රටවල නිෂ්පාදන හා සේවා පාදක ආර්ථිකයන් ද වර්ධනය වී ඇති අතර සංවර්ධිත රටවල සේවා ආර්ථිකය පදනම් කර ගෙන ඇති බව පෙනේ. **දැනුම් ආර්ථික ක්‍රියාකාරකම්වලට නිදසුන් නම්, පර්යේෂණ, තාක්ෂණික සහාය සහ උපදේශනයන් ය.**

- තොරතුරු යුගයේ දී ගෝලීය ආර්ථිකය, දැනුම් ආර්ථිකය වෙත යොමු විය. තොරතුරු යුගයට මෙම සංක්‍රමණය ඇතුළත් වන්නේ, සේවා කාර්යක්ෂම, නිෂ්පාදන කාර්යක්ෂම හා ශ්‍රම සූක්ෂ්ම ආර්ථික වර්ධනයන්ගෙන් ලබා ගන්නා ලද හොඳම භාවිතයන් ය. දැනුම හා දැනුම පදනම් කර ගත් සාධක එකතු කර ඇති අන්තර් සම්බන්ධතා සහ ගෝලීය ආර්ථිකය සඳහා ප්‍රවේශ වන දැනුම සහ වෙළෙඳ රහස් ආර්ථික වර්ධනයේ තීරණාත්මක සාධකයන් වන අතර, ආර්ථික සම්පතක් ලෙස ද වැදගත් වේ.

- දැනුම හා අධ්‍යාපනය යනුවෙන් හඳුන්වන මානව ප්‍රාග්ධනය ඵලදායි වත්කමක් ලෙස හෝ ව්‍යාපාර නිෂ්පාදනයක් ලෙස හෝ යොදා ගන්නා ආකාරය පිළිබඳ ව අවධානය යොමු කරයි. නිෂ්පාදිත පරිභෝජනයට හෝ අපනයන සඳහා හෝ යොදා ගත හැකි අතර මානව ප්‍රාග්ධනය ව්‍යාපාර සඳහා සහ ආර්ථිකය සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට යොදා ගත හැකි ය.

## දැනුම පදනම් කර ගත් ආර්ථිකයේ ආශ්‍රිත වැදගත් සංකල්ප

- දැනුම්කරුවන්
- දැනුම් ඉංජිනේරුවන්
- දැනුම් ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- බුද්ධිමය දේපොළ

## දැනුම් ආර්ථිකය කරා යාමේ අභියෝග

- ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි අනුපාතිකය පහළ මට්ටමක පැවතීම
- මේ නිසා සමාජයේ අධ්‍යාපන මට්ටම පහළ මට්ටමක පවතී. මේ නිසා මානව ප්‍රාග්ධන සමුච්චිතය පහළ ගොස් ඇත.
- පර්යේෂණ හා සංවර්ධනය සඳහා වැය කරන අරමුදල් පහළ මට්ටමක පැවතීම
- ශ්‍රී ලංකාව තුළ පවතින අඩු නිපුණතා සහ අඩු වැටුප් පදනම් කර ගත් කාර්මීකරණ ක්‍රියාවලිය නිසා දැනුම් කේන්ද්‍රීය ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය කරා නැඹුරුවීමේ හැකියාව අඩු වී ඇත.
- 1998 වන විට ශ්‍රී ලංකාව පහළ ආදායම් ලබන රටක සිට පහළ මැද ආදායම් ලබන රටක් බවට පත් වීමත් සමඟ ශ්‍රී ලංකාවට විදේශවලින් ලැබෙන ප්‍රදානයන් හා ආධාර සීමා වීම.
- මේ නිසා අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට ආයෝජනය කළ හැකි මුදල් ප්‍රමාණය අඩු වී ඇත.
- ඍජු විදේශ ආයෝජන අඩු තාක්ෂණය සහිත ශ්‍රම සූක්ෂ්ම කර්මාන්ත වෙත බහුල වශයෙන් ගලා ඒම නිසා මානව ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමේ ඉඩ ප්‍රස්තා අඩු වීම

## දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශකය

- දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශකය සකස් කිරීමට පහත සඳහන් නිර්ණායක යොදා ගනී.
    - ආර්ථික සානුබලය සහ ආයතනික ව්‍යූහය
    - නවෝත්පාදන හා තාක්ෂණය උපයෝගී කර ගැනීමේ නැඹුරුව
    - අධ්‍යාපනය හා පුහුණුව
    - ICT යටිතල පහසුකම්

  **මෙම දර්ශකය අනුව 2012 වර්ෂයේ ප්‍රමුඛස්ථානය ගත් රටවල්**

    - ස්වීඩනය
    - ෆින්ලන්තය
    - ඩෙන්මාර්කය
    - නෙදර්ලන්තය
    - නෝර්වේ

- නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල වැඩිප්‍රතිලාභ හිමි වූයේ නාගරික අංශයට යි. එම නිසා ශ්‍රී ලංකාවේ ඉහළ ආර්ථික වෘද්ධියක් හා සමාජ සංවර්ධනයක් හිමි කර ගනු ලැබුවේ බස්නාහිර පළාතින් කොළඹ දිස්ත්‍රික්කය යි. දිවයිනේ සෙසු පළාත් හා දිස්ත්‍රික්ක ඊට සමගාමී ව අඩු සංවර්ධන මට්ටමක් හිමි කර ගත් නිසා තුලිත ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති තෝරා ගත් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීමට සිදු විය.

- ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත, උතුරු පළාත, ඌව පළාත යන පළාත්වල විරැකියාව, ආදායම් ව්‍යාප්ත වීමේ විෂමතාව හා දරිද්‍රතාව ඉහළ මට්ටමක තිබූ අතර යටිතල පහසුකම් හා මානව නිපුණතා සංවර්ධනය අඩු මට්ටමක පැවතිණි. මේ නිසා එම දිස්ත්‍රික්ක අළලා ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පැන නැගුණි. ඒ සඳහා විවිධ ව්‍යාපෘති හඳුන්වා දෙන ලදී.

  නිදසුන් : ග්‍රාම ශක්ති ව්‍යාපාරය, ගම්පෙරලිය වැඩ සටහන, උදාගම් වැඩ සටහන, ගම නැගුම, ගැමි පුබුදුව, ගැමිදිරිය, ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම

## 12.3 : සමකාලීන ආර්ථික සිදු වීම් සහ ප්‍රතිපත්ති විමර්ශන කරයි.

- **ආර්ථිකයට දේශීය හා ගෝලීය සිදු වීම් බලපාන ආකාරය විස්තර කරයි.**
- **දේශීය හා ගෝලීය ආර්ථික සිද්ධිවලට නිදසුන් දක්වයි.**
- **දේශීය හා ගෝලීය ආර්ථික සිද්ධි ඇති වීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.**
- **සමකාලීන ආර්ථික ප්‍රතිපත්ති විස්තර කරයි.**

### ආර්ථිකයට බලපාන දේශීය හා ගෝලීය සිදුවීම්

- වර්තමාන ලෝකයේ සෑම රටක් ම බාහිර ලෝකයට විවිධ ප්‍රමාණවලින් විවෘත ව පවතී. එනම් ආවෘත ආර්ථිකයන් දක්නට නැත. එම නිසා ආර්ථිකයක ක්‍රියාකාරිත්වයට දේශීය සංසිද්ධි මෙන් ම ගෝලීය සිදු වීම් ප්‍රබල බලපෑමක් ඇති කරනු ලබයි.
- **මෙහි දී දේශීය හා ගෝලීය සිදු වීම් ආර්ථිකයේ විවිධ අංශ වෙත ඍජුව ම හෝ වක්‍ර ලෙස බලපෑම් ඇති කරයි. එනම් සාර්ව ආර්ථිකයේ,**
    - නිෂ්පාදනය
    - සේවා නියුක්තිය
    - මිල මට්ටම
    - පොළී අනුපාතිකය
    - අන්තර් ජාතික වෙළෙඳාම
    - ගෙවුම් ශේෂය
    - විදේශ විනිමය අනුපාතිකය
    - ප්‍රාග්ධන වෙළෙඳපොළ යන අංශ කෙරෙහි බලපෑම් ඇති කරයි.

### ආර්ථිකයට බලපාන දේශීය සිදු වීම්වලට නිදසුන්

- **ආණ්ඩු බලය වෙනස් වීම**

  නිදසුන් ඃ

- 1977 බලයට පත් වූ නව රජය ක්‍රියාත්මක කළ විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා විදේශ වෙළෙඳ රටාව, දේශීය වෙළෙඳ රටාව, කර්මාන්ත ව්‍යුහය, මූල්‍ය හා බැංකු පද්ධතිය මුළුමනින් ම වෙනස් විය.
- 1994 ආණ්ඩු බලය වෙනස් වීම් සමඟ ඇති වූ ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස් වීම් නිසා ආර්ථිකය ගමන් කළ දිශාව කිසියම් ප්‍රමාණයකින් වෙනස් විය. එනම් ආර්ථිකයේ විවෘත භාවය ඉතා සුළු ප්‍රමාණයකින් අඩු කිරීම, පෞද්ගලීකරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම, මිල ස්ථායිතාව, සේවා වියුක්ති ගැටලු අවම කිරීම, නීතිය හා සාමය තව දුරටත් ශක්තිමත් කිරීම ආදි වශයෙන් කාලීන වෙනස්කම් ගණනාවක් සිදු විය.
- 2006 වර්ෂයේ දී ආණ්ඩු බලය වෙනස් වීම මත දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ නව ආර්ථික ප්‍රතිපත්ති හා ගැළපුම් ක්‍රියාත්මක කිරීම සිදු විය.
    - දේශීය කෘෂිකාර්මික අංශය ශක්තිමත් කිරීම

- පෞද්ගලීකරණ වැඩ පිළිවෙළ සීමා කිරීම

- 2015 ආණ්ඩු බලය වෙනස් වීමත් සමග නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම, සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් කරා නැඹුරු වීම, යහපාලනය පිළිබඳ කතිකාව, ජාතික ඒකාබද්ධතාවක් ඇති කිරීම, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත ප්‍රවේශ වීම ආදි වෙනස්කම් සිදු විය.

- **1983 සිට 2009 දක්වා (අවුරුදු 30) පැවති යුද තත්ත්වය**
- මේ නිසා රටේ යටිතල පහසුකම්. කර්මාන්ත ශාලා, කෘෂිකාර්මික ගොවිබිම් විනාශ වූ අතර, නිෂ්පාදනය පහළ වැටිණි. විරැකියාව වැඩි විය. දේශීය සම්පත් ඌන උපයෝජනයට ලක් විය. රජයට ආරක්ෂක කටයුතු වෙනුවෙන් විශාල වියදමක් දැරීමට සිදු විය.

- 1989 සිට 1991 දක්වා දිවයිනේ සෙසු ප්‍රදේශවල පැවති සිවිල් අරගල සිදු වීම ද රටේ නිෂ්පාදනය පහළ යාමට මිල මට්ටම ඉහළ යාමට, දේපොළ සම්පත් හා යටිතල පහසුකම් විනාශ වීමට හේතු විය.

- **වරින් වර ඇති වූ ස්වාභාවික උපද්‍රව**
  - 2004 වර්ෂයේ ඇති වූ සුනාමි තත්ත්වය
  - වරින් වර ඇති වූ ගංවතුර හා නායයාම්
  - වරින් වර ඇති වූ නියඟ තත්ත්වයන්
  - වන සතුන්ගෙන් ඇති වන හානි

## ආර්ථිකයට බලපෑ ගෝලීය සිදු වීම් සඳහා නිදසුන්

1. **ආසියාතික මූල්‍ය අර්බුදය**

- මේ නිසා අග්නිදිග ආසියා කලාපයේ මූල්‍ය වෙළෙඳපොළ දැඩි පීඩනයකට ලක් වීම නිසා හා එම කලාපයේ විදේශ ව්‍යවහාර මුදල් ඒකක දැඩි ලෙස අවප්‍රමාණය විය. මේ නිසා ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම, එම කලාපයෙන් ආනයනය කරන භාණ්ඩ මිල ගණන් ඉහළ යාම සිදු විය.

2. **යුරෝපා ආර්ථික අර්බුදය**

- 2006 වසරේ සිට ඇමරිකානු හා යුරෝපා කලාපවල ඇති වූ ආර්ථික අවපාතය නිසා එම කලාපයේ නිෂ්පාදනය පහළ ගිය අතර, විරැකියාව වැඩි විය. මිල මට්ටම් ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. දැඩි රාජ්‍ය ණය අර්බුදයක් හට ගැණිනි. මෙය ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳපොළ, විදේශ සේවා නියුක්තිය , විදේශ ආයෝජන අඩු වීම කෙරෙහි විශාල බලපෑමක් ඇති කෙරිණ.

3. **ගෝලීය ආර්ථිකයේ රටවල් අතර දිගින් දිගට ම ඇති වූ අර්බුදයන්**

- විශේෂයෙන් ඉරාකය, ඇෆ්ගනිස්ථානය, සිරියාව, ආදී රටවල ඇති වූ යුද ගැටුම් නිසා ඛනිජ තෙල් මිල ඉහළ යාම ශ්‍රී ලංකාවේ ආනයන වෙළෙඳපොළ පහළ යාම, විදේශ ආයෝජන අඩු වීම සිදු විය.

4. **ලෝකයේ ඛනිජ තෙල් හා රන් මිල ගණන් ඉහළ යාම.**

- මේ නිසා ලංකාවේ ආනයන වියදම ඉහළ යාම, ගෙවුම් ශේෂ හිඟය, රුපියලේ විදේශ අගය පහළ යාම, බලශක්ති හා බැඳුණු උද්ධමනය ඉහළ යාම, ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි බලපා ඇත.

5. **ලෝක ආහාර හිඟය**

2000 වසරේ මුල් වකවානුවේ දී ලෝකයේ ආහාර නිෂ්පාදනය කරන රටවල්වල ඇති වූ බලපෑම නිසා සහ ඉන්ධන නිෂ්පාදනයට ආහාර විශාල වශයෙන් භාවිත කිරීම නිසා දැවැන්ත ආහාර හිඟයක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට ආනයනය කරන තිරිඟු පිටි, කිරි පිටි, සීනි ආදී ආහාර මිල ගණන් ශීඝ්‍රයෙන් වැඩි විය.

6. **ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා විවිධ කලාපවල ඇති වූ ස්වාභාවික උපද්‍රව**

ශීඝ්‍ර කාර්මීකරණයත් සමඟ ගෝලීය අවකාශයට මුදා හැරෙන අහිතකර වායූන් නිසා ගෝලීය උෂ්ණත්වය ශීඝයෙන් ඉහළ යාමෙන් ග්ලැසියර් දියවීමෙන් සාගර ජල මට්ටම ඉහළ යාම සිදු වේ. එමෙන් ම සාගර සම්පත් විනාශ වීම, බෝග එලදාව අඩු වීම ද මේ නිසා සිදු වේ. කෘෂි කාර්මික රටක් වශයෙන් ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි මෙම තත්වය විශාල ලෙස බලපෑම් ඇති කරයි.

## ශ්‍රී ලංකාව 2030 දී සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ගෝලීය අරමුණු

1. **දිළිඳුකම දුරලීම.**
   - වසර 2030 වන විට කිසිවකු දිළින්දකු නොවිය යුතුය.
   - වසර 2030 වන විට දිළිදු සහ අවදානමට පත් ප්‍රජාවන් ඇතුළුව සියලු දෙනා ආවරණය විය යුතුය.

2. **සාගින්න දුරලීම.**
   - වසර 2030 වන විට සෑම ආකාරයකම මන්ද පෝෂණය දුරලීම.

3. **මනා සෞඛ්‍යය හා යහපැවැත්ම**
   - වසර 2030 වන විට මාතෘ මරණ අනුපාතිකය සජීවී දරු උපත් 10,000ට 7ක් දක්වා අඩු කිරීම.
   - සෑම තැනකම, සියලු දෙනාටම සෞඛ්‍ය ආවරණය සහ සෞඛ්‍යාරක්ෂණ සේවා වෙත ප්‍රවේශය සහතික කල යුතුය.
   - නවජාත මරණ අනුපාතිකය සජීවි දරු උපත් 1000ට 12 දක්වා අඩු කිරීම.
   - වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ මරණ අනුපාතිකය 1000ට 25ක් දක්වාවත් අඩු කිරීම.
   - බෝ නොවන රෝග හේතුවෙන් අඩු වයසින් සිදු වන මරණ ප්‍රමාණය තුනෙන් එකකින් අවම කිරීම.
   - මාර්ග අනතුරු වලින් සිදු වන මරණ සංඛ්‍යාව අඩකින් අඩු කිරීම.
   - සෑම තැනකම, සෑම දෙනෙකුටම ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යාරක්ෂක සේවා වෙත ප්‍රවේශය තහවුරු කිරීම.

4. **ගුණාත්මක අධ්‍යාපනය**
   - සියලු පිරිමි හා ගැහැණු ළමයින්ට ප්‍රාථමික අධ්‍යාපනය වෙත ප්‍රවේශය තහවුරු කිරීම.
   - රැකියා හා ව්‍යවසායකත්වය සඳහා අවශ්‍ය කුසලතා වලින් යුක්ත තරුණ හා වැඩිහිටි ජන සංඛ්‍යාව ප්‍රමාණවත් ලෙස වැඩි කිරීම.
   - සැවොම ඇතුලත් කරගන්නා ඉගෙනුම් පරිසරයක් සැමට තහවුරු කරමින් අධ්‍යාපන පහසුකම් නැංවීම.
   - සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් ලෙස ඉහළ නැංවීම.

**5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය**

- අඩු වයස් හා බලහත්කාර විවාහ වැනි හානිකර ක්‍රියා දුරලීම.
- සෑම මට්ටමකම නායකත්වයෙහි කාන්තාවන්ගේ පූර්ණ සහභාගීත්වය තහවුරු කිරීම.

**6. පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව**

- සෑම තැනකම, සැමටම සුරක්ෂිත හා පහසුවෙන් ලබා ගත හැකි පානීය ජලය වෙත සම ප්‍රවේශය ලබා දිම.

**7. පහසුවෙන් ලබා ගත හැකි හා පිරිසිදු බල ශක්තිය**

- සැමට ම පහසුවෙන් ලබා ගත හැකි විශ්වාසනීය හා නවීන බලශක්ති ලබා දීම.

**8. සුනිසි රැකියා සහ ආර්ථික වර්ධනය**

- සැමටම පූර්ණ හා ඵලදායී රැකියා ලබා දීම.
- රැකියාවක, අධ්‍යාපනයේ හෝ පුහුණුවක යෙදී නොසිටින තරුණ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීම.
- ළමා ශ්‍රමය හා එහි සියලු ස්වරූප මුළුමනින්ම දුරලීම.

**9. කර්මාන්ත, නවෝත්පාදනයන් සහ යටිතල පහසුකම්**

- සියලු දෙනාට පහසුවෙන් ලබාගත හැකි හා සාධාරණ ප්‍රවේශ අවස්ථා ලබා දීම.
-

**10. අවම අසමානතා**

- වයස, ලිංගිකභාවය, ආබාධ සහිත බව, ජාතිය, ජන වර්ගය, උපත, ආගම, ආර්ථිකය හෝ වෙනත් සාධක නොසලකා, සියලු දෙනා සමාජ, ආර්ථික සහ දේශපාලනික වශයෙන් ඇතුළත් කර ගන්නා සුළු තත්වයන් ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- ජනගහනයෙහි පහලම 40% ආදායම් වර්ධනය ජාතික සාමාන්‍යයට වඩා ඉහල වේගයකින් වර්ධනය වන තත්වයක් අත්පත් කර ගැනීම හා එම වර්ධනය ස්ථාවර කිරීම.

**11. චිරස්ථායි පුරවර හා ප්‍රජා**

- සැමට ගුණාත්මක තිරසර හා ප්‍රත්‍යස්ථ යටිතල පහසුකම් ලබා දීම තහවුරු කල යුතුය.

**12. වගකීම් සහගත පරිභෝජනය සහ නිශ්පාදනය**

- ජනනය කරනු ලබන කසල ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අවම කිරීම.

**13. දේශගුණය සම්බන්ධ ක්‍රියාකාරීත්වය**

- ස්වාභාවික ආපදා දරා ගැනීමේ හැකියාව ශක්තිමත් කිරීම.

**14. ජලය යට ජීවිතය**

- අඩු වශයෙන් වෙරළ හා සමුද්‍ර ප්‍රදේශයෙන් 10% ක් සංරක්ෂණය කිරීම.

**15. මිහි මත ජීවිතය**

- සුරක්ෂිත පරිසර පද්ධති සංරක්ෂණය කිරීම තහවුරු කිරීම සහ ජෛව විවිධත්වය අහිමි වීම නැවැත්වීම.

**16. සාමය, යුක්තිය, ශක්තිමත් ආයතන**

- සෑම අකාරයකම ප්‍රචණ්ඩත්වයන් සහ ඒ හා සම්බන්ධ මරණ අනුපාතිකයන් ලොව සෑම තැනකම සැලකිය යුතු මට්ටමින් අවම කිරීම.

**17. මෙම අරමුණු වෙනුවෙන් හවුල්කාරීත්වය**

- හැකියාවන් ලබා දෙන තාක්ෂණය ශක්තිමත් කිරීම.
- සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයන සැලකිය යුතු මට්ටමින් වර්ධනය කිරීම.
- ණය බර අවම කිරීම සඳහා සම්බන්ධීකරණය කරන ලද ප්‍රතිපත්ති හඳුන්වා දීම.

**ගෝලීය වෙළඳපොළ තුල ශ්‍රී ලංකාවේ තරඟකාරීත්වයට ඇති අභියෝග**

- ස්ථාවර ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක් නොමැති වීම.
- යටිතල පහසුකම් වල ගුණාත්මකභාවය ප්‍රමාණවත් නොවීම.
- නිලධාරීවාදය
- පර්යේෂණය හා සංවර්ධනය සඳහා අවධානය ප්‍රමාණවත් නොවීම.
- නවෝත්පාදන කෙරෙහි යොමු කර ඇති අවධානය අඩු වීම.

මේවා තුරන් කර ගැනීමට කටයුතු කළහොත් ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරඟකාරීත්වය ඉහළ යාමේ ඉඩ ප්‍රස්ථා වැඩි වීම.

**2017-2020 රාජ්‍ය ආයෝජන වැඩ සටහනේ ඉලක්ක**

1. ඵලදායිත්වය හා තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම මගින් අපනයන වල අඩු වීම වැලැක්වීම.
2. ආයෝජන හිතකාමී ප්‍රතිපත්ති තුලින් විදේශ ආයෝජනය ගලනය ප්‍රවර්ධනය කිරීම.
3. රාජ්‍ය ආදායම ඉහල නැංවීම හා රාජ්‍ය වියදම් සහේතුක කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම.
4. වාර්ශික ණය සේවා බර අඩු කිරීම සඳහා රාජ්‍ය ණය ප්‍රති ව්‍යුහගත කිරීම.
5. මානව සම්පත් වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා රාජ්‍ය වියදම් වැඩි කිරීම.
6. ආර්ථික හා සමාජ ක්ශේත්‍රයන්හි සමානාත්මතාව තහවුරු කිරීම.
7. පළාත් අතර විශමතා අවම කිරීම.
8. පරිසර ආරක්ෂාව හා ස්භාවික සම්පත් සංරක්ෂණය කෙරෙහි අවධනයක් යොමු කිරීම.

## ජාතික ප්‍රතිපත්ති රාමුව, රට හදන සෞභාග්‍යයේ දැක්මට අනුව,

**2020-2025 සාර්ව ආර්ථික ඉලක්ක**

1. ආර්ථික වර්ධන වේගය 6.5% ත් ඉහළට
2. ඇ.ඩො. 6500 ඉක්මවා යන ඒක පුද්ගල ආදායමක්
3. සේවා වියුක්ති අනුපාතය 4% ට වඩා අඩු අගයක්
4. වාර්ෂික උද්ධමන අනුපාතය 5% වඩා අඩු අගයක්
5. අයවැය හිඟය ද.දේ.නි.ප්‍රතිශතයක් ලෙස 4% වඩා අඩු අගයක්
6. තනි ඉලක්කම් පොලි අනුපාතිකයක්
7. රුපියලේ අගය ස්ථාවර මට්ටමක

**සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුව**

1. විදේශීය ණය ප්‍රමාණය අඩු කිරීමට කටයුතු කිරීම.
2. අයවැය හිඟය අඩු කිරීම.
3. වෙළඳ හිඟය අඩු කිරීම.
4. දේශීය නිශ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා අමුද්‍රව්‍ය හා අතරමැදි භාණ්ඩ සඳහා ආනයන බදු අඩු කිරීම.
5. ජාත්‍යන්තරව තරඟකාරී කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අමුද්‍රව්‍ය සහ අතරමැදි භාණ්ඩ සඳහා ආනයන බදු අඩු කිරීම.
6. ජත්‍යන්තරව තරඟකාරී කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණික උපකරණ සඳහා ආනයන ගාස්තු රහිතව සිදු කිරීම.

7. ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ද්‍රවශීලතා අරමුදල සඳහා අවදානම වැඩි මූල්‍ය ආයතන නැවත ස්ථාවර කිරීම සඳහා කටයුතු කිරීම.
8. ආහාර සුරක්ෂිතාවය තහවුරු කිරීම.

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."